# දොරවක කන්ද ලෙන ප්‍රාග් ඓතිහාසික කැනීමෙන් හමු වූ පුරාකෘති ඔස්සේ හෙළිවන එකල මානවයාගේ ජීවන රටාව පිළිබඳව අධ්‍යනය


එම්.ඩබ්.එල් කරුණාරත්න[1],ඩබ්.අයි.පී කුමාරි[2]

සමාජීය විද්‍යා අධ්‍යයනාංශය, ශ්‍රී ලංකා රජරට විශ්ව විද්‍යාලය
priya950313@gmail.com



මුඛ්‍ය පදඃ දොරවකකන්ද ලෙන, පුරාවිද්‍යාත්මක වැදගත්කම, මානවයා, චිත්‍ර


## හැඳින්වීම

මානව ඉතිහාසය පිළිබඳව කතා කරන විට ප්‍රාග් ඓතිහාසික යුගය ඉතා වැදගත් වේ. ප්‍රාග් ඓතිහාසික යුගය පිළිබඳව තොරතුරු සොයන විට සබරගමුව පළාත විශේෂී කේන්ද්‍රස්ථානයක් බව පෙනෙයි. ප්‍රාග් ඓතිහාසික මානව සමාජයේ ස්වරූපය පිළිඹිබු කරන සාක්ෂි ගණනාවක් සබරගමුව පළාත ආශ්‍රිත ප්‍රදේශවලින් හමු වී තිබීම එයට හේතුවයි. ඒ අතරින් "දොරවකකන්ද ලෙන" ප්‍රමුඛස්ථානයක් ගනියි. පහතරට තෙත් කලාපීය ගල් ලෙනකට අයත් මෙය සබරගමුව පළාතේ කෑගල්ල දිස්ත්‍රික්කයේ ඒබිඩ්ගල නම් ග්‍රාමයේ පිහිටා ඇති අතර ඇතුපනේ ගල්ලෙන, ඇතුබැඳි ගල්ලෙන ආදී වශයෙන් හඳුන්වනු ලබයි. මෙය අද වන විට ලංකාවේ පුරාවිද්‍යාත්මක සාධක රැසක් මතු කරන ස්ථානයක් බවට පත්ව ඇත.

## පර්යේෂණ ක්ෂේත්‍රය

මෙ මඟින් දොරවකකන්ද ලෙන පිළිබඳව සාහිත්‍ය මූලාශ්‍රය හා පුරාවිද්‍යාත්මක සාධක උපයෝගී කර ගනිමින් අධ්‍යනය කරනු ලබයි. එනම් කැනීම් වාර්තා ආශ්‍රිතයෙන් දත්ත රැස් කිරීමත් එම දත්ත විශ්ලේෂණය කිරීම හා දත්ත ඉදිරිපත් කිරීමත් මෙහි දී සිදුව ඇත. තව ද ක්ෂේත්‍ර අධ්‍යනයන් මඟින් විවිධ පුද්ගලයන් හමු වී කරුණු සාකච්ඡා කර තොරතුරු එක්රැස් කරන ලදි.

## අරමුණ

දොරවකකන්ද ලෙන පිළිබඳව තොරතුරු ඉදිරිපත්ව ඇති පුරාවිද්‍යාත්මක මූලාශ්‍රය හඳුනාගැනීම හා එම මූලාශ්‍ර පිළිබඳව පුරාවිද්‍යාත්මක ගවේෂකයන්, ශාස්ත්‍රගවේෂකයන්, විද්‍යාර්ථයන් දැනුවත් කරීම.

## සාකච්ඡාව

දොරවකකන්ද ලෙනෙහි පුරාවිද්‍යාත්මක වැදගත්කම පෙන්වා දෙන විට ඒ ආශ්‍රිත පර්යේෂණ යටගියාව වැදගත්වේ. මෙම ලෙන ප්‍රථම වරට තොරතුරු අනාවරණය වූයේ 1918 වසරේ දී "ජර්නල් ඔෆ් සිලෝන් ඇන්ටික්වේරියන්ස් ලිටරසි රෙජිස්ටර්" නම් සඟරාවේ 18 වැනි කලාපයට G.F.R බුවුනින් කළ ලිපියකිනි. ඉන්පසුව පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව වෙනුවෙන් සිරාන් උපේන්ද්‍ර දැරණියගල මහතා හා W.H විජේපාල මහතා මේ හා සම්බන්ද කැනීම් කටයුතු සිදුකර ඇත.

මෙම ලෙනෙහි පුරාවිද්‍යාත්මක වැදගත්කම පිළිබඳව සාච්ඡා කරන විට කැනීමෙන් හමුවන ධාන්‍ය අංශු වැදගත් වෙයි. පුරාවිද්‍යාත්මක කැනීමක් මඟින් පාංශු ස්තර ආශ්‍රයෙන් වවන ලද ධාන්‍ය අංශු මෙන්ම කැලෑවේ වැවෙන ලද ධාන්‍ය අංශු හමුවූ මුල්ම අවස්ථාව මෙයයි.

කැනීම් තොරතුරුවලට අනුව මෙම ධාන්‍ය අංශු අළු හා අඟුරු සමඟ අර්ධ වශයෙන් පිලිස්සී තිබූ බව වර්තා වී ඇත. ඒ අනුව අතීත මානවයා ධාන්‍ය පුළුස්සා අඹරා රත්කර ආහාරයට ගන්නට ඇති බවට තහවුරු වේ. මෙම ලෙන ආශ්‍රිත කැනීම් මඟින් ශිලා මෙවලම් ද සොයාගෙන ඇති අතර එ තුළින් ද මෙහි පුරාවිද්‍යාත්මක අගය මනාව තහවුරුවේ. විශාල හා මධ්‍යම ප්‍රමාණයේ තැළුම් හා ඇඹරුම් මෙවලම් මෙහි දක්නට ලැබුනු අතර 2වැනි ස්තරයේ සිට ඉහළට සෑම ස්තරයකම මේවා පොදුවේ දක්නට ලැබේ. විශාල හා මධ්‍යම ප්‍රමාණයේ ශිලා මෙවලම් ඇතිල්ලීම් තුළින් නිර්මාණය කර ඇත. එ මඟින් එකල මානවයා තමන්ගේ ආහාර ක්‍රම , දඩයම් ක්‍රම සඳහා ශිලා මෙවලම් භාවිතා කරමින් කාර්‍යයන් ඉටුකළ ආකාරය තහවුරුවේ.

මෙම ලෙන ආශ්‍රිත කැනීම්වලදී අස්ථි මෙවලම් හා සත්ව අවශේෂ ද හමුව ඇති අතර ශිලා මෙවලම් වලට සාපේක්ෂව සත්ව අවශේෂ හමු නොවුනි. බලංගොඩ, බටදොඹලෙන, බෙලිලෙන ආදී ලෙන්වල සේ මෙහි අස්ථි මෙවලම් හා සත්ව අවශේෂ හමුනොවුනත් කැනීමෙන් අනාවරණය වූ සමස්ත එකතුව අස්ථි කැබලි කීපයක් සත්ත්ව දත් හා බෙලි කටුවලට සීමා වීමත් දක්නට ලැබී ඇත. එ තුළින් මෙකල මානවයා මධ්‍ය ශිලා යුගයේ මානවයා මෙන්ම දඩයමින් හා රැස්කරීමෙන් නව අවශ්‍යතා ඉටු නොකර ගත් බව කියවේ. මැටි බඳුන් මෙම ලෙන ආශ්‍රයෙන් සොයා ගත් තවත් වැදගත් පුරවිද්‍යාත්මක සාධකයක් වන අතර ප්‍රාග් ඓතිහාසික යුගයට අයත් මැටි බඳුන් හමු වූ පළමු අවස්ථාව මෙයවේ. මේවා කේත වර්ණ හා කාල වර්ණ වන අතර මානවයාගේ ජීවන රටාවේ තාක්ෂණය මුසු වූ වර්ධිත මට්ටමක් පෙන්නුම් කරනු ලබයි.

පුරවිද්‍යාත්මක වටිනාකම පිළිබඳව කතා කරනවිට ගුහා චිත්‍ර වලට ඉතා වැදගත් ස්ථානයක් හිමිවේ. මෙහි ගුහා චිත්‍ර 52 ක් පමණ දක්නට ලැබේ. මෙයින් සිතුම් 31 කැනීමට පෙර දකගත හැකි වූ අතර අනෙකුත් සිතුවම් පසුව අනාවරණය වී ඇත. මෙම සිතුවම් ප්‍රොටෝ ඓතිහාසික, යුගයට අයත් විය හැකි බවට අදහස් ඉදිරිපත් වී ඇත. මෙම චිත්‍ර අතරින් පහළ සිතුම්වලට වඩා ඉහළ සිතුවම් වර්ධිත මට්ටමක් පෙන්නුම් කරයි. සත්ත්ව රූප , ජ්‍යාමිතික හැඩතල ආදිය මෙම සිතුවම්වල අනතර් ගත වී ඇත. මෙකල යුගයේ මානවයා තමන්ගේ අදහස් ප්‍රකාශනය කිරීම උදෙසා චිත්‍ර භාවිත කරන්නට ඇති අතර ඉහළ අදහස් හුවමාරුවක් තිබූ බවට අනාවරණය වේ. විශේෂයෙන් කුරුටු ගෑමෙන් හා සීරීම් මගින් නිර්මාණය කළ මෙම චිත්‍ර සඳහා විවිධ වර්ණ භාවිතා කර ඇත. මෙයට ස්වාභාවික පරිසරයේ ද්‍රව්‍ය යොදා ගන්නට ඇති බව චිත්‍ර අධ්‍යනයෙන් තහවුරු වේ. මෙම කරුණු සැලකිල්ලට ගෙන මෙකල මානවයා තමන්ගේ ජීවන රටාව කෙරෙහි මෙම සිතුවම්හි එන සංකේත තම ජීවිතය හා බැඳීමක් ඇති කර ගත් බවට තහවුරු වේ.

අදවන විට ලෙන ආශ්‍රිත භූමිය ගත්විට නයිල් නම් පෞද්ගලික වතු රබර් යායක පිහිටා ඇති අතර මෙය ආරක්ෂාව වෙනුවෙන් පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව විසින් රැකවල්කරුවෙකු පත් කර ඇත.එ මඟින් සිය කැනීම් කටයුතු කළ ආකාරය දක්නට ඇති අතර ආරක්ෂාව වෙනුවෙන් නිවේදන ද නිකුත් කර ඇත. ඉහත කී චිත්‍ර නරඹන්නන් විසින් කුරුටු ගා විනාශ කළ බවක් අද වන විට දක්නට ඇති අතර ග්‍රාමයේ සිටින සමහර පුද්ගලයන් මෙම ලෙන පිළිබඳව නොදන්නා බවක් දක්නට ලැබේ. විශේෂයෙන් මෙම පර්යේෂණය තුළින් මෙතෙක් මේ පිළිබඳව ඉදිරිපත්ව ඇති තොරතුරු යොදාගත් ක්‍රමවේදයට අනුව දත්ත රැස් කිරීම, විශ්ලේෂණය මෙන් ම ඉදිරිපත් කිරීම තුළින් මේ පිළිබඳ ව විමර්ශනය කරන්නට අවශ්‍ය තොරතුරු ලබා ගැනීමටත් හැකියාව ලැබේ. කෙසේ

වෙතත් මෙකී පුරාවිද්‍යාත්මක දත්ත තුළින් අපගේ අතීත මානවයාගේ එක් හැරවුම් ලක්ෂ්‍යයක් පිළිබඳ තොරතුරු සමුදායක් ලබා ගැනීමට හැකිවීමක් බවට මෙම දොරවකකන්ද ලෙන පෙන්වාදිය හැකිය.

**ආශ්‍රිත ග්‍රන්ථ**


Wijepala, W.H.(1997) ***New light on the prehistory of Sri Lanka in the context of resent investigations at cave sites.*** University of Peradeniya.